# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1991 අංක 15 දරන
# ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදුකෙරෙන අපරාධ වැළැක්වීමේ සහ දඬුවම් පැමිණවීමේ පනත

---

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 15 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1991 මාර්තු මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : ශත 60 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

# 1991 අංක 15 දරන ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදු කෙරෙන අපරාධ වැළැක්වීමේ සහ දඬුවම් පැමිණවීමේ පනත.

[සහතිකය සටහන් කළේ 1991 මාර්තු මස 15 වන දින.]

එල්. ඩී.—ඕ. 60/88

**තානාපති අනුයෝජිතයන්ද ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදුකෙරෙන අපරාධ වැළැක්වීම සහ දඬුවම් පැමිණවීම පිළිබඳව වූ සම්මුතිය බලාත්මක කිරීම පිණිස සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා ද වූ පනතකි.**

**පූර්විකාව.**

තානාපති අනුයෝජිතයන් ද ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදුකෙරෙන අපරාධ වැළැක්වීම සහ දඬුවම් පැමිණවීම පිළිබඳ සම්මුතියක් එක්දහස් නවසිය හැත්තෑතුනේ දෙසැම්බර් මස දහ හතරවන දින නිව්යෝර්ක්හි දී අත්සන් කරන ලද හෙයින් ද:

ශ්‍රී ලංකාවද මෙම සම්මුතිය පිළිගැනීමට අදහස් කරන හෙයින් ද:

එකී සම්මුතියේ විධිවිධාන බලාත්මක කිරීම සඳහා නීතිමය විධිවිධාන සැලැස්වීම අවශ්‍යව ඇති හෙයින් ද:

දැන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.**

1\. මේ පනත 1991 අංක 15 දරන ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදු කෙරෙන අපරාධ වැළැක්වීමේ සහ දඬුවම් පැමිණවීමේ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, 1973 දෙසැම්බර් මස 14 වන දින නිව්යෝර්ක් හි දී අත්සන් කරන ලද තානාපති අනුයෝජිතයන් ද ඇතුළුව ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව කෙරෙන අපරාධ වැළැක්වීම සහ දඬුවම් පැමිණවීම පිළිබඳ (මෙහි මින් මතු "සම්මුතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) සම්මුතිය ශ්‍රී ලංකාව වෙනුවෙන් බලාත්මකවීම ආරම්භ වන දිනය ලෙස සහතික කරනු ලබන දිනයේදී ක්‍රියාත්මක විය යුතු ය.

**අමාත්‍යවරයා විසින් සම්මුති රටවල් සහතික කිරීම.**

2\. ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් කලින් කල, සම්මුතියට පාර්ශ්වකරුවන් වන රටවල් සහතික කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ කරන ලද නියමයක් බලාත්මකව ඇත්තේ යම් රටක් වෙනුවෙන් ද ඒ රට මෙහි මින් මතු "සම්මුති රට" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

**ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදු කෙරෙන වැරදි.**

3\. (1) ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිටත දී ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකුට මරණය සිදුකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදක් කරන අතර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත පැවැත්වෙන නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබීමේ දී මරණීය දණ්ඩනය නියම කළ යුතු ය.

(2) ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිටත දී ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකු අපහරණය කරන හෝ පැහැරගෙන යන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදක් කරන අතර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු හත දක්වා දීර්ඝ විය හැකි කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය.

(3) ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිටතදී ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකුට ශාරීරිකව හෝ ඔහුගේ නිදහසට පහරදෙන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදක් කරන අතර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු හත දක්වා දීර්ඝ විය හැකි කාල සීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන් දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය.

(4) ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිටත දී ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකුට ශාරීරිකව හෝ ඔහුගේ නිදහසට හානි සිදුවන අන්දමින් ඔහුගේ නිල ස්ථානයට, පෞද්ගලික වාසස්ථානය හෝ ගමනාගමන ක්‍රමයකට ප්‍රචණ්ඩ පහරදීමක් සිදුකරන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදක් කරන අතර, මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී අවුරුදු හත දක්වා දීර්ඝ විය හැකි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට හෝ යටත් විය යුතු ය.

(5) ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිට දී (1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ හෝ (3) වන උපවගන්තියේ හෝ (4) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ යම් වරදක්—

(අ) සිදු කිරීමට තර්ජනය කරන හෝ කුමන්ත්‍රණය කරන ;

(ආ) සිදු කිරීමට තැත් කරන ; හෝ

(ඇ) සිදු කිරීමෙහි ලා අනුබල දෙන

යම් තැනැත්තෙක් මේ පනත යටතේ වූ වරදක් කරන අතර මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා පත්‍රයක් මත පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, එම තැනැත්තා විසින් සිදු කිරීමට තර්ජනය කිරීම සම්බන්ධයෙන් හෝ සිදු කිරීමට කුමන්ත්‍රණය කිරීම සම්බන්ධයෙන් හෝ සිදු කිරීමට තැත් කිරීම සම්බන්ධයෙන් හෝ සිදු කිරීමෙහි ලා අනුබල දීම සම්බන්ධයෙන් ඔහු වරදකරු කරනු ලැබ ඇත්තේ යම් වරදක් සම්බන්ධයෙන්ද එම වරද ඔහු විසින් සිදු කරන ලද්දේ නම් ඔහු යටත් විය හැකිව තිබූ දඬුවමටම ඔහු යටත් විය යුතු ය.

(6) මේ වගන්තියේ, "අනුබල දීම" යන්නට දණ්ඩ නීති සංග්‍රහයේ 100 වන සහ 101 වන වගන්තිවල දී ඇති අර්ථයම ඇත්තේ ය.

සාක්ෂි.

4. මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් වන යම් නඩු පැවරීමක දී විදේශ කටයුතු පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අත්සන යටතේ වූ සහතිකයක නම් කරනු ලැබූ තැනැත්තකු මේ පනතේ අර්ථානුකූලව ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකු බවට සහතික කරන එම සහතිකය තවදුරටත් ඔප්පු කිරීමක් නොමැතිව සාක්ෂි වශයෙන් පිළිගත යුතු අතර, එම සහතිකය, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පෙනෙන සාක්ෂියක් විය යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි විභාග කිරීමට මහාධිකරණයට ඇති අධිකරණ බලය.

5. (1) මේ පනත යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන්, ලිඛිත නීතිය මගින් විධිවිධාන සළස්වා ඇති ආකාරයට නඩු ඇසීමට, විභාග කිරීමට සහ තීරණය කිරීමට ශ්‍රී ලංකාවේ මහාධිකරණයට මෙයින් අධිකරණ බලය පවරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියෙන් ශ්‍රී ලංකාවේ මහාධිකරණයට පැවරුණු අධිකරණ බලය කොළඹ දී පවත්වන මහාධිකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

මේ පනත යටතේ වූ වැරදි සඳහා සිරභාරයට ගනු ලැබූ ඇතැම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්.

6. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන තැනැත්තකු මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් සිරභාරයට ගනු ලැබූ අවස්ථාවක දී—

(අ) ඔහු පුරවැසියකු නම් හෝ ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට අන්‍යාකාරයකින් හිමිකම් ඇත්තේ නම් හෝ ඔහු අදේශික තැනැත්තකු නම් ඔහු ඉල්ලා සිටින සහ ඔහුගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට කැමැත්තෙන් සිටින ළඟම රාජ්‍යයක උචිත නියෝජිතයෙකු සමඟ ප්‍රමාදයක් නොමැතිව පණිවුඩ හුවමාරු කර ගැනීමට ; සහ

(ආ) එම රාජ්‍යයේ නියෝජිතයකුට ඔහුව හමුවීමට පැමිණීමට, ඔහුට හිමිකම් තිබිය යුතු ය.

ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ප්පන පනත සංශෝධනය කිරීම.

7. ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ප්පන පනතේ උපලේඛනයෙහි 'ආ' කොටසට පෙරාතුවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් ජාතික රාජ්‍ය සභාවේ එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(38) (ආ) 1991 අංක 15 දරන ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තන්ට විරුද්ධව සිදු කෙරෙන අපරාධ වැළැක්වීමේ හා දඬුවම් පැමිණවීමේ පනතේ අර්ථානුකූලව එම තැනැත්තාට ශාරීරිකව හෝ ඔහුගේ නිදහසට හානි සිදුවිය හැකි අන්දමින් ඔහුගේ නිල ස්ථානයට, පෞද්ගලික වාසස්ථානයට හෝ ගමනාගමන ක්‍රමයකට ප්‍රචණ්ඩකාරී ලෙස පහර දීම ;".

දැනට පවත්නා, උදර්පන වැඩ පිළිවෙලවල් වලින් උපලේඛනයේ ඇති වැරදි සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වෙන බව.

8. ශ්‍රී ලංකා ආණ්ඩුව හා සම්මුති රටක් අතර උදර්පන වැඩ පිළිවෙලක් බලාත්මකව ඇති අවස්ථාවක දී, එම වැඩ පිළිවෙලට ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් උදර්පනය සඳහා වූ විධිවිධාන ඇතුළත් ලෙස සලකනු ලැබිය යුතු ය.

උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් වන විට, සම්මුතිය ශ්‍රී ලංකාව සහ සම්මුති රටක් අතර උදර්පන වැඩපිළිවෙලක් වශයෙන් අමාත්‍යවරයා විසින් සලකනු ලැබිය හැකි බව.

9. ශ්‍රී ලංකා ආණ්ඩුව සහ සම්මුති රටක් අතර ඇති කරගත් උදර්පන වැඩ පිළිවෙලක් බලාත්මකව නොපවතින අවස්ථාවක ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උදර්පන පනතේ කාර්ය සඳහා සම්මුතිය මේ පනතේ උපලේඛනයේ සඳහන් වැරදි සම්බන්ධයෙන් උදර්පනය සඳහා විධිවිධාන සලස්වමින් ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් සම්මුති රටක් සමග ඇති කරගත් උදර්පන වැඩ පිළිවෙලක් වශයෙන් සලකනු ලැබිය හැකි ය.

අර්ථ නිරූපණය.

10. මේ පනතෙහි—

"ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකු" යන්නෙන්—

(1) අදාළ රාජ්‍යයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය නායකයකුගේ කර්තව්‍ය ඉටු කරන පාලක සංවිධානයක යම් සාමාජිකයකු ද ඇතුළුව රාජ්‍ය නායකයකු ද, ආණ්ඩුවේ ප්‍රධානියා හෝ විදේශ කටයුතු භාර අමාත්‍යවරයා ද විදේශ රටක සිටින විට දී ගමනාගමනයේ දි හෝ අන්‍යාකාරයකින් සිටින විට ඔහු ද ඔහු සමග යන ඔහුගේ පවුලේ සාමාජිකයන් ද;

(2) තමාට, තම නිල ස්ථානයට, තම පෞද්ගලික වාසස්ථානයට හෝ තමාගේ ගමනාගමන ක්‍රමයකට විරුද්ධව යම් අපරාධයක් සිදු කරනු ලැබූ විට සහ සිදු කරනු ලබන ස්ථානයක දී ජාත්‍යන්තර නීතියට අනුකූලව තම ශරීරයට නිදහසට හෝ තත්වයට මෙන්ම ඔහුගේ නිවසේ කොටසක් සංයුක්ත වන ඔහුගේ පවුලේ සාමාජිකයන්ට ද සිදු කළ හැකි යම් පහරදීමකට විරුද්ධව විශේෂ

ආරක්ෂාව ලැබීමට හිමිකම් ඇත්තා වූ ද, රාජ්‍යයක යම් නියෝජිතයකු හෝ බලධරයකු නැතහොත් අන්තර් ආණ්ඩු ස්වභාවයේ යම් ජාත්‍යන්තර සංවිධානයක යම් නිලධරයකු හෝ අනුයෝජිතයකු වන තැනැත්තෙක් ද

අදහස් වේ.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

### උපලේඛනය (8 වන සහ 9 වන වගන්ති)

1. ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකුට මරණය සිදු කිරීම, අපහරණය කිරීම හෝ ශරීරයට හෝ නිදහසට පහර දීමක් සිදු කිරීම.

2. ජාත්‍යන්තර වශයෙන් ආරක්ෂිත තැනැත්තකුගේ ශරීරයට හෝ නිදහසට හානි සිදුවිය හැකි අන්දමේ ප්‍රචණ්ඩ පහරදීමක් ඔහුගේ නිල ස්ථානයට, පෞද්ගලික වාසස්ථානයට හෝ ගමනාගමන ක්‍රමයකට සිදු කිරීම.

3 (අ) ඉහත (1) හෝ (2) වන විෂයයන්හි සඳහන් කරනු ලැබ ඇති අන්දමේ යම් ක්‍රියාවක් සිදු කිරීමට තර්ජන කිරීම හෝ කුමන්ත්‍රණය කිරීම;

(ආ) ඉහත (1) හෝ (2) වන විෂයයන්හි සඳහන් කරනු ලැබ ඇති අන්දමේ යම් ක්‍රියාවක් සිදු කිරීමට තැත් කිරීම;

(ඇ) ඉහත (1) හෝ (2) වන විෂයයන්හි සඳහන් කරනු ලැබ ඇති අන්දමේ යම් ක්‍රියාවක් සිදු කිරීමට අනුබල දීම.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල් සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.